**පාලක මණ්ඩලය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

2024 නොවැම්බර් 21 **මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන විධාන** 2024 අංක 03

**මුදල් සමාගම් විසින් තැන්පතු භාර ගැනීම**

**1. නෛතික ප්‍රතිපාදන**

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 133(1) වන වගන්තිය සමඟ කියවිය යුතු 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12(1) වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාර ව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍ර ලබා දී ඇති සියලුම මුදල් සමාගම් සඳහා අදාළ වන තැන්පතු භාර ගැනීම සම්බන්ධ ව මෙම විධාන මින් නිකුත් කරනු ලැබේ.

**2. විධානවල අරමුණු**

තැන්පතුකරුවන් ආරක්ෂා කිරීම සහ තැන්පතු භාර ගැනීම, ප්‍රචාරණ දැන්වීම් පළ කිරීම සහ තැන්පතු භාර ගැනීම සඳහා දිරිගැන්වීමේ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය තත්වයන් නිශ්චිතව දැක්වීම ඔස්සේ මුදල් සමාගම් අතර සාධාරණ තරඟකාරීත්වයක් ප්‍රවර්ධනය කිරීම මෙම විධානවල අරමුණ වේ. මුදල් සමාගම් විසින් තැන්පතු භාර ගැනීම වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා දායක වීම ද මෙම විධානයන්හි අරමුණ වේ.

**3. අදාළත්වය**

සියලු මුදල් සමාගම් වෙත නිකුත් කිරීමේ දිනයේ සිට මෙම විධානයන් බලපැවැත්වෙනු ඇත.

**4. අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ වගකීම්**

4.1 අධ්‍යක්ෂ මණ්ඩලය සහ මුදල් සමාගමේ අදාළ ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන් පහත කාර්යයන් සඳහා වගකිව යුතු ය.

අ) තැන්පතු ගිණුම් ආරම්භ කිරීම, අලුත් කිරීම සහ වසා දැමීම සහ තැන්පතු භාර ගැනීම සඳහා ප්‍රචාරණ දැන්වීම් පළ කිරීම සහ දිරිගැන්වීමේ යෝජනා ක්‍රම ලබා දීම යන ක්‍රියාවලි සම්බන්ධ ව අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි අනුමත කිරීම සහ ක්‍රියාත්මක කිරීම මෙන්ම, සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වා ගෙන යෑම; සහ

ආ) ගනුදෙනුකරු හඳුනා ගැනීමේ රීති, ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීති, මුදල් විශුද්ධිකරණය වැලැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැලැක්වීම පිළිබඳ මාර්ගෝපදේශ, මූල්‍ය ගනුදෙනුකරුවන් සුරැකීමේ රෙගුලාසි ඇතුළුව තැන්පතු භාර ගැනීමට අදාළ වෙනත් නියාමන අවශ්‍යතා සමඟ අනුකූල වීම.

4.2 ඉහත 4.1. අ) විධානයෙහි සඳහන් පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ ක්‍රියාවලි අවම වශයෙන් පහත සංරචකවලින් සමන්විත යුතු ය;

අ) මුදල් සමාගමකට පවත්වා ගෙන යා හැකි තැන්පතු වර්ග සහ විවිධ තැන්පතු වල ලක්ෂණ;

ආ) අවම වශයෙන් තබා ගත යුතු ලියකියවිලි, තැන්පතුකරුවන්ගෙන් ලබා ගත යුතු තොරතුරු සහ අනුගමනය කළ යුතු රීති සහ රෙගුලාසි ඇතුළු ව, තැන්පතු ගිණුම් ආරම්භ කිරීම, අලුත් කිරීම සහ වසා දැමීම පිළිබඳ ව මෙහෙයුම් උපදෙස්;

ඇ) බද්ධ ගිණුම්, බාලවයස්කාර ගිණුම්, ජ්‍යෙෂ්ඨ පුරවැසි ගිණුම් යනාදී විශේෂ ස්වභාවයන්ගෙන් යුත් තැන්පතු ගිණුම් ආරම්භ කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම ට අදාළ කොන්දේසි සහ නියමයන්;

ඇ) තැන්පතු ගිණුම් ආරම්භ කිරීම, අලුත් කිරීම් සහ වසා දැමීමට අදාළ වන ගාස්තු සහ අය කිරීම්;

ඉ) කාලීන තැන්පතු කල් පිරීමට පෙර වසා දමා මුදල් ආපසු ගැනීමට අදාළ වන කොන්දේසි සහ නියමයන්;

ඊ) අක්‍රිය තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳ පටිපාටි;

උ) මිය ගිය තැන්පතුකරුවෙකුගේ තැන්පතු ගිණුම් පියවීම;

ඌ) තැන්පතු ගිණුම්වලට අදාළ තොරතුරුවල රහස්‍යභාවය;

එ) තැන්පතු භාර ගැනීම සඳහා වන ප්‍රචාරණ දැන්වීම් තුළ ඇතුළත් විය යුතු අවම තොරතුරු සහ එවැනි ප්‍රචාරණ දැන්වීමක් නිර්මාණය කිරීමේ දී සහ ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලියේ දී අනුගත විය යුතු වෙනත් අවම කොන්දේසි;

ඒ) තැන්පතු භාර ගැනීම සඳහා භාවිතා කරන දිරි ගැන්වීමේ යෝජනා ක්‍රම තුළ සපුරා ගත යුතු නිර්ණායක සහ ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය.

**5. තැන්පතු භාර ගැනීම සඳහා වන පොදු කොන්දේසි**

5.1 තැන්පතු වර්ග:

අ) මුදල් සමාගමක් විසින් මසකට වඩා අඩු කාලයක් තුළ හෝ තැන්පතුවක් භාර ගත් දිනයේ සිට මාස හැටක කාලයකින් පසු ආපසු ගෙවිය යුතු ඕනෑම කාලීන තැන්පතුවක් භාර නොගත යුතු අතර, එවැනි කාලීන තැන්පතු අලුත් කිරීමේ දී, එම තැන්පතුවක් එලෙස අලුත් කළ දිනයේ සිට එක් මසකට වඩා අඩු කාලයක් තුළ හෝ මාස හැටක කාලයකින් පසු ආපසු ගෙවිය යුතු වන්නේ නම්, එවැනි කාලීන තැන්පතුවක් අලුත් නොකළ යුතු ය.

ආ) මුදල් සමාගමකට ඉතුරුම් තැන්පතු භාර ගත හැකි ය.

ඇ) මුදල් සමාගම විසින් ඉල්ලුම් තැන්පතු භාර නොගත යුතු ය.

ඇ)මුදල් සමාගමකට තැන්පතුකරුවන් වෙත ඕනෑම වෙනත් නව තැන්පතු වර්ගයක් (පුනරාවර්තන තැන්පතු[1] වැනි දෑ) පිරිනැමිය හැකි අතර, එම තැන්පතු වර්ග වල ලක්ෂණ

[1]ආයෝජනය මත පූර්ව නිර්ණය කරන ලද ඵලදාවක් උපයා ගැනීම සඳහා පූර්ව නිර්ණය කරන ලද කාලයක් සඳහා ක්‍රමික කාල පරාසයන් (සාමාන්‍යයෙන්, මාසික ව) ස්ථාවර අගයක් තැන්පත් කිරීමට තැන්පතුකරුවන්ට ඉඩ ලබා දෙයි.

තැන්පතුකරුවන් වෙත නොමග යවන සුලු ආකාරයෙන් තොරව දැනුම් දිය යුතු ය.

5.2 මුදල් සමාගම විසින් භාරගත් හෝ අලුත් කරන ලද සෑම තැන්පතුවක් සඳහා ම තත් කාලීන පදනමක් මත, තැන්පත්කරු සමග එකඟ වූ පරිදි මුද්‍රිත හෝ විද්‍යුත් ස්වරූපයෙන්, අදාළ ගනුදෙනුව සඳහා සාක්ෂියක් ලබා දිය යුතු අතර, එය මුදල් සමාගම විසින් යම් මුදලක් භාර ගන්නා ලද බවට පිළිගැනුමක් ලෙස සැලකිය යුතු ය.

5.3 මුදල් සමාගම විසින් ව්‍යාපාර කාලය තුළ දී සිය තැන්පතුකරුවන් කෙරෙහි පවතින වගකීම් ඉටු කිරීමට සහ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ තැන්පතුකරුගේ තොරතුරු පවත්වා ගෙන යෑමේ අවශ්‍යතා ඇතුළු ව සියලු ම නියාමන අවශ්‍යතා සමඟ අනුකූල වීම සඳහා සෑම තැන්පතුවකට ම අදාළ ව ප්‍රමාණවත් වාර්තා/ලේඛන පවත්වා ගෙන යා යුතු ය.

5.4 දිරිගැන්වීමේ යෝජනා ක්‍රම, හඳුන්වාදීමේ කොමිස් යෝජනා ක්‍රම හෝ තැන්පතු ප්‍රවර්ධනය කරන වෙනත් ඕනෑම යෝජනා ක්‍රමයන් හි පිරිවැය ද ඇතුළුව, මුදල් සමාගම විසින් තැන්පතු වෙත පිරිනමනු ලබන පොලී අනුපාතික, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් යම් උපරිම පොලී අනුපාතික සීමාවක් පනවා ඇත්නම්, එය නොඉක්මවිය යුතු ය.

5.5 මුදල් සමාගම විසින් එහි තැන්පතු, කොටස් හෝ වෙනත් ඕනෑම මූල්‍ය උපකරණ ලෙස පරිවර්තනය නොකළ යුතු ය.

**6. තැන්පතු භාර ගැනීම සඳහා වන ප්‍රචාරණ දැන්වීම්**

6.1 මුදල් සමාගම විසින් ප්‍රචාරණ දැන්වීම්, අලෙවිකරණය සඳහා භාවිත කරන උපකරණයන් හෝ තැන්පතු භාර ගැනීමට යොදා ගන්නා ඕනෑම උපකරණයක් තුළ නිරවද්‍ය සහ නොමඟ නොයවනසුලු තොරතුරු (ලිඛිත,වාචික, ශ්‍රව්‍ය හෝ ශ්‍රව්‍ය-දෘශ්‍ය වුව ද) සැපයිය යුතු ය. සියලු ම වැදගත් තොරතුරු තැන්පත්කරුවන්ට එවැනි තොරතුරු පැහැදිලි ව අවබෝධ කර ගැනීමට පහසු වන පරිදි දෘශ්‍යමාන/ වටහා ගත හැකි ආකාරයෙන් ඇතුළත් කළ යුතු ය.

6.2 මුදල් සමාගමක් විසින් තැන්පතු භාර ගැනීම් සඳහා පුවත්පත්, නිවේදන සහ කුඩා පත්‍රිකා ඇතුළු, මුද්‍රිත මාධ්‍යයන්හි පළ කරනු ලබන, ශ්‍රව්‍ය හෝ ශ්‍රව්‍ය - දෘශ්‍ය මාධ්‍යයන්හි සම්ප්‍රේෂණය කරන හෝ විකාශනය කරනු ලබන, වෙබ් අඩවි, අන්තර්ජාලය සහ සමාජ මාධ්‍යයන්හි පළ කරන ලද හා දැන්වීම් පුවරු, බැනර් හෝ ධජ ඔස්සේ ප්‍රදර්ශනය කරන ලද සෑම ප්‍රචාරණ දැන්වීමක් ම සහ අදාළ මුදල් සමාගම විසින් මහජනතාවගෙන් සෘජුව ම හෝ වක්‍ර ව තැන්පතු භාර ගන්නා බව සඳහන් කරන වෙනත් ඕනෑම ආකාරයක ප්‍රචාරණයක් ම:

අ) එක හා සමාන අක්ෂර ප්‍රමාණයකින් දක්වන ලද නාමික පොලී අනුපාතිකය සහ වාර්ෂික සඵලදායී පොලී අනුපාතිකය.

ආ) එම සමාගම 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී මුදල් සමාගමක් බව.

ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගත් ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිත ආයතනයක් විසින් මුදල් සමාගම වෙත ආසන්නතම කාලයේ දී නිකුත් කරන ලද ණය ශ්‍රේණිගත කිරීම.

ඇ) මුදල් සමාගමේ වෙබ් අඩවිය වෙත පිවිසිය හැකි වෙබ් සබැඳියක්, යනාදී කරුණුවලින් සමන්විත විය යුතු ය.

7. තැන්පතු භාර ගැනීම සඳහා වන දිරි ගැන්වීමේ යෝජනා ක්‍රම

7.1 මුදල් සමාගම විසින් තැන්පතුකරුවන් වෙත අවාසිදායක තත්ත්වයක් ඇති කිරීමට හේතු විය හැකි, තැන්පතුවෙහි ලක්ෂණ විකෘති වන ආකාරයේ ලොතරැයි වැඩසටහන්, තෑගි යෝජනා ක්‍රම (උත්සව කාලීන/ ප්‍රවර්ධනාත්මක) හෝ වෙනත් ඕනෑම යෝජනා ක්‍රම ක්‍රියාත්මක නොකළ යුතු ය. නිදසුන් ලෙස ඉතුරුම් ගිණුම් සඳහා සාපේක්ෂ ව අවම පොලී අනුපාතික, ඉතුරුම් ගිණුම් වලට කාලීන තැන්පතුවල ගති ලක්ෂණ ඇතුළත් කිරීම, යනාදිය සැලකිය හැකි ය. එමෙන් ම, පහත කොන්දේසි ද අදාළ වේ:

අ) දිරිගැන්වීමේ යෝජනා ක්‍රමයට අදාළ තැන්පතු වර්ගයෙහි මුදල් යොදවා ඇති සියලු ම තැන්පතුකරුවන් ඇතුළත් විය යුතු ය;

ආ) දිරිගැන්වීමේ යෝජනා ක්‍රමයෙහි පිරිවැය තැන්පතුකරුවන්ගෙන් අයකර නොගත යුතු ය;

ඇ) තැන්පතුකරුවන්ට අනර්තකාරී වන, අතිරේක නියමයන් සහ කොන්දේසි දිරිගැන්වීමේ යෝජනා ක්‍රමවලට නොපැනවිය යුතු ය.

ඈ) දිරිගැන්වීමේ යෝජනා ක්‍රමයට අදාළ සියලු තොරතුරු පැහැදිලි ව තැන්පතුකරුවන් වෙත දැනුම් දිය යුතු ය.

7.2 මුදල් සමාගම විසින් තැන්පතු භාර ගැනීමේ දී පිරිවැය තැන්පතුකරුගෙන් අයකර ගනු ලබන, කිසිදු හඳුන්වා දීමේ කොමිස් යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක නොකළ යුතු ය.

**8.** **බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ බලතල**

යම් තැන්පතු වර්ගයක්, සෘජුව හෝ වක්‍රව තැන්පතු භාර ගැනීම සඳහා ප්‍රචාරය කරන ප්‍රචාරණ දැන්වීමක් හෝ තැන්පතු භාර ගැනීම සඳහා වූ යම් දිරි ගැන්වීමේ යෝජනා ක්‍රමයක් මෙම විධානවල දක්වා ඇති විධිවිධාන සමග අනුකූල නොවන්නේ නම් හෝ පොදු ජනතාව නොමග යවන්නේ නම්, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට, එවැනි නිෂ්පාදිත, ප්‍රචාරණ දැන්වීම හෝ දිරිගැන්වීමේ යෝජනා ක්‍රමය, නියම කරන ලද ආකාරයට අනුව නිශ්චිත කාල සීමාවක් ඇතුළත, සංශෝධනය කිරීමට හෝ නවතා දැමීමට, නියෝග කළ හැකි ය.

**9.** **නිර්වචන**

9.1 මෙම විධානවල අරමුණු සඳහා පහත නිර්වචන අදාළ විය යුතු ය:

අ) මුදල් සමාගමක් විසින් යම් නිශ්චිත කාල සීමාවකට පසු ආපසු ගෙවීමේ එකඟතාව ඇති ව භාර ගනු ලබන ඕනෑම තැන්පතුවක් **"කාලීන තැන්පතුවක්"** ලෙස අදහස් කෙරේ.

ආ) **"දිරිගැන්වීමේ යෝජනා ක්‍රමයක්"** යනුවෙන් පොලියකට අමතර ව

තැන්පතුකරුවන් වෙත මුදල් හෝ මුදල්මය නොවන ප්‍රතිලාභ ලබා දෙන වැඩපිළිවෙළක් අදහස් කෙරේ.

ඇ) වැල් පොලියහි බලපෑම සැලකිල්ලට ගැනීමෙන් පසු ව, **තැන්පතු ගිණුමක්** ප්‍රකාශිත පොලී අනුපාතිකයට අනුව වසරක දී උපයනු ඇති පොලිය ප්‍රතිශතයක් ලෙස දක්වන අගය**"වාර්ෂික සඵලදායී පොලී අනුපාතිකය"** යනුවෙන් අදහස් කෙරේ.

**10. විධාන/රීති/ මාර්ගෝපදේශ/ චක්‍රලේඛ අවලංගු කිරීම**

10.1 පහත දක්වා ඇති විධාන/රීති/ මාර්ගෝපදේශ/ චක්‍රලේඛ මෙම විධාන නිකුත් කිරීමේ දිනයේ සිට අවලංගු කෙරේ:

අ) 2005 අංක 01 දරන මුදල් සමාගම් (තැන්පතු) විධානය

ආ) 2001 අංක 05 දරන මුදල් සමාගම් (තැන්පතු - දිරිගැන්වීමේ යෝජනා ක්‍රම) විධානය

ඇ) 2006 අංක 01 දරන මුදල් සමාගම් (ප්‍රචාරණ දැන්වීම්) රීතිය

ඈ) 2007 අංක 01 දරන මුදල් සමාගම් (බාලවයස්කරුවන් සඳහා ඉතුරුම් ගිණුම් පවත්වා ගෙන යෑම) මාර්ගෝපදේශ

ඉ) 2010 අංක 02 දරන මුදල් සමාගම් (තැන්පතු වගකීම් රක්ෂණ) විධානය

ඊ) 2010 අංක 02 දරන මුදල් සමාගම් (තැන්පතු වගකීම් රක්ෂණ) විධානයට අදාළ ව 2013.10.07 දිනැති චක්‍රලේඛය

**ආචාර්ය පී.නන්දලාල් වීරසිංහ**
පාලක මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති